පුවත් වාර්තාවක් ලියූ මාධ්‍යවේදියා අතින් නොව අදාළ පුවත්පත් කර්තෘවරයා අතින් එහි සිරස්තල යෙදෙනා අවස්ථාවන් තිබේ. එවන් ඇතැම් අවස්ථාවකදී පුවත්පත් කර්තෘවරුන් විසින් සිරස්තලයට වැඩි ආකර්ෂණයක් ලබාදීම සඳහා හෝ සිරස්තලය තුළ අඩු වචන ප්‍රමාණයක් පවත්වා ගැනීම සඳහා යොදාගන්නා ඇතැම් යෙදුම් කෙතරම් ශිෂ්ට සම්පන්නද යන්න ගැටළුකාරී වන අවස්ථා මතුවේ.

ඊට උදාහරණ ලෙස පහත පුවත් වාර්තාවන් දැක්විය හැක. මෙම පුවත් වාර්තාවන්හි සිරස්තලය තුළ "ජාවාරමා/ජාවාරමුන්" ලෙසින් සඳහන් වූවත්, පුවත් අන්තර්ගතය තුළ "ජාවාරම්කරුවන්" ලෙසින් දැක්වේ. "ජාවාරමා" වැනි යෙදුම් කෙතරම් දුරට සමාජයේ ශිෂ්ට සම්පන්න චින්තනයක් හැඩගැස්වීම සඳහා යෝග්‍ය වන්නේද? එසේ යෝග්‍ය නොවන්නේ නම්, මාධ්‍ය මගින් මෙවැනි යෙදුම් නැවත නැවතත් භාවිතා කිරීම කෙතරම් යෝග්‍ය වන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Mawbima